# LANKABARANA
**Astrology Services**

Tel: +942702788
E-mail: barana1950@yahoo.com
Web: lankabarana.com

නම ..........................................................

අංකය ..........................................................







උපන් දිනය 1982.07.17

උපන් ස්ථානය [illegible]

උපන් වේලාව පෙ.ව/ප.ව: 06.30

දවස: සෙනසුරාදා නැකත: ස්වාති

## ග්‍රහ පිහිටීම

| | | | | | |
|---|---|---|---|---|---|
| රවි | 00.32 | බුධ | 20.56 | ශනි | 22.33 |
| චන්ද්‍ර | 08.17 | ගුරු | 07.22 | රාහු | 19.08 |
| කුජ | 26.57 | ශුක්‍ර | 02.02 | කේතු | 19.08 |

## මහ දශා විස්තරය

| | | | | | |
|---|---|---|---|---|---|
| උපතේ | සිට 1983.04.28 | දක්වා | රවි | මහ දශාව |
| 1983.04.28 | සිට 1993.04.28 | දක්වා | සඳු | මහ දශාව |
| 1993.04.28 | සිට 2000.04.28 | දක්වා | අඟහරු | මහ දශාව |
| 2000.04.28 | සිට 2018.04.28 | දක්වා | රාහු | මහ දශාව |
| 2018.04.28 | සිට 2034.04.28 | දක්වා | බ්‍රහස්පති | මහ දශාව |

ග්‍රහ තත්ත්වය

බුධ දොළොස් වැන්න තුල ස්වක්ෂේත්‍ර තත්ත්වයට පත්ව සිටින හෙයින් 'නිපුණ' යෝගය ඇති කෙරේ. එබැවින් විවිධ දේවල් සම්බන්ධයෙන් පවත්නා දැනුම හා අවබෝධය ඇතිවේ. මෙම ස්ථානයේ බුධ තැන්පත්ව ඇත්තේ සිකුරු සමගය. එබැවින් කලාත්මක දේවල් සම්බන්ධයෙන් යම් දැනුමක් හා අවබෝධයක් පවතී. එහෙත් මෙම යෝගය දොළොස් වැන්න තුල තැන්පත්ව ඇති හෙයින් උසස්ම වූ ආකාරයෙන් ක්‍රියාත්මක නොවූවද සාමාන්‍ය තත්ත්වයෙන් යුක්ත වේ. බුද්ධිය යොදා කරනු ලබන දේවල් වලින් යම් යම් ප්‍රතිලාභයක් අත්පත් කර ගැනීමට පිළිවන.

රවි ලග්නගතව සිටින හෙයින් අදහස් ඍජු තත්ත්වයෙන් පවතින අතර තම අදහස් වෙනස් කිරීමට වැඩි වශයෙන් උනන්දුවක් නොගනී. කෙසේ හෝ තම කාර්යය ඉටු කිරීමට සමත් වේ. මෙසේ රවි ලග්න ගතව සිටින හෙයින් කෙසේ හෝ ඉදිරියට ගොස් තම කාර්ය සිද්ධිය ඉටුකර ගැනීමට සමත් වේ.

අඟහරු සෙනසුරු තුන් වැන්න තුල තැන්පත්ව ඇත. එබැවින් 'ශනිමංගල' යෝගය ඇති කෙරේ. මේ නිසා සිය කාර්යක්ෂමතාව බෙහෙවින්ම වැඩි කෙරේ. යම් යම් දේවල් වඩාත් උසස් කළමනාකාරීත්වයක් යටතේ ඉටු කිරීමට හැකියාව ඇත. කෙසේ හෝ දියුණුවක් ලබා ගැනීමට වෙහෙසක් දරණ හෙයින් ජීවිතය කුමන බාධාවක් මධ්‍යයේ වුවද ඉදිරියට ගෙන යෑමට ශක්තිය හා ධෛර්ය සම්පන්න භාවය ඇති කෙරේ.

මෙම යෝගයෙන් මෙවැනි යහපත් තත්ත්වයන් ඇති වුවද මෙය විවාහය සම්බන්ධයෙන් යහපත් පිහිටීමක් නොවන අතර විවාහය තුල යම් යම් අපහසුකම් වැනි දේවල් ඇති වීමට ඉඩ ඇත. එබැවින් විවාහයේදී වඩාත් කල්පනාකාරීව කටයුතු කළහොත් මෙම අයහපත් තත්ත්වයක් අවම කර ගැනීමට පිළිවන.

මෙම කේන්ද්‍රයේ පවත්නා ග්‍රහ තත්ත්වයක් අනුව යම් යම් සැප සම්පත් වැනි දේවල් අත්පත් කර ගැනීමට අවස්ථාවක් ඇති කෙරේ. ජීවිතයේ මුල් කාලයට වඩා ඉදිරිය යහපත් භාවයෙන් යුක්ත වේ.

විවාහය සම්බන්ධ විස්තර

හත් වැන්න විවාහය සම්බන්ධ බලවත්ම ස්ථානයයි. මෙම ස්ථානය හිමි සෙනසුරු තුන් වැන්න තුල අඟහරු සමග සම්බන්ධ වී ඇත. මේ අතර මෙම හත් වැන්න හිමි සෙනසුරු දෙවැන්න අධිපති රවිගේ දෘෂ්ටියට ලක් කෙරෙන අතර හත් වැන්න රවිගේ දෘෂ්ටියටද ලක් කෙරේ. මෙම ග්‍රහ තත්ත්වයන් කීපයම විවාහය සම්බන්ධයෙන් යහපත් පිහිටීම් නොවන අතර විවාහය තුල යම් යම් අපහසුකම් වැනි දේවල් ඇති කරයි. එබැවින් විවාහයක් කර ගන්නා විට විධිමත් ආකාරයෙන් කේන්ද්‍ර ගලපා ගතහොත් මෙම තත්ත්වයන් අවම කර ගැනීමට අවස්ථාවක් ඇති කෙරේ.

2011 නොවැම්බර් මාසයේ 13 වැනි දින රාහුගේ මහ දශාවේ සිකුරුගේ අන්තර් දශාවක් පටන් ගෙන ඇත. මෙම අන්තර් දශාව පටන් ගැනීමත් සමග විවාහය සම්බන්ධයෙන් අදහස් ඇති කෙරේ. මෙම අන්තර් දශාව යහපත් තත්ත්වයෙන් පවත්නා අතර 2012 අගෝස්තු මාසයෙන් පසුව විවාහය සම්බන්ධයෙන් පවත්නා ග්‍රහ තත්ත්වය යහපත් හෙයින් 2013 වර්ෂය ඇතුලත විවාහය සිදු වීමට ඉඩ ඇත.

මෙම හත් වැන්න සෙනසුරුට හිමි සෙනසුරු අඟහරු සමග සම්බන්ධ හෙයින් විවාහය සඳහා ලැබෙන පුද්ගලයා කාර්මික අංශ කෙරේ සම්බන්ධව කටයුතු කරන කෙනෙකි. වේගවත් අදහස් වලින් යුක්තය. සමහර අවස්ථා වලදී තම අදහසම ක්‍රියාත්මක කිරීමට උනන්දු වේ. ඔබ ලබන සහකරු නිරෝගීය. යම් යම් දේවල් කෙරේ දක්ෂතා ඇති කෙනෙකි. එහෙත් ඔහු වඩාත් පොහොසත් කෙනෙකු නොවේ. සාමාන්‍ය තත්ත්වයේ කෙනෙකි. විශාල දේපලක් හෝ විශාල වස්තු සම්පත් ඇති කෙනෙකු නොවූවද ඔහු ධෛර්ය සම්පන්න හෙයින් විවාහයෙන් පසුව තත්ත්වය යහපත් වේ.

මෙම කේන්ද්‍රයේ පවත්නා ග්‍රහ තත්ත්වය අනුව විවාහය සියයට සියයම යහපත් නොවූවද විවාහය පවත්වා ගෙන යෑමට හැකියාව ඇත. ඔබ විවාහයේදී වඩාත් ඉවසීමෙන් යුක්තව කටයුතු කළ යුතුය. ඔබේ විවාහය සඳහා ලැබෙන අය විදේශ සේවා වලට සම්බන්ධ කෙනෙකු නොවේ.

මෙම කේන්ද්‍රයේ වැන්දඹු දෝෂ හෝ බලවත් අයහපත් තත්ත්වයන් නොමැත. විධිමත්ව කේන්ද්‍ර ගලපා ගැනීමෙන් එම දෝෂ අවම කර ගැනීමට පිලිවන. යෝජිත විවාහයකි.

## රැකියාව හා සම්බන්ධ විස්තර

රැකියා කාරක ස්ථානය හිමි අඟහරු සෙනසුරු සමග සම්බන්ධ වී සිටින අතර මෙම අඟහරුගේ දෘෂ්ටියට දහ වැන්න ලක්වේ. එසේ දහ වැන්න අඟහරු ගෙන් දුර්වල තත්ත්වයට පත් වුවද මෙම දහ වැන්න බ්‍රහස්පතීගේ දෘෂ්ටියෙන් බලවත් තත්ත්වයට පත්ව ඇති හෙයින් ඔබට ගුරු, ලිපිකරු වැනි රැකියාවක් ලබා ගැනීමට වාසනා ගුණය ඇති කෙරේ. විදේශ රැකියා සම්බන්ධයෙන් ඇති ආශාවන් පහසු ක්‍රමයන් ගෙන් ඉටුකර ගැනීමට අවස්ථා ඇති නොවේ. දේශීය වශයෙන් රැකියාවක් ලබා ගැනීමට අවස්ථාව පවතී. එහෙත් මෙම කාලයේ සෙනසුරු හතර වැන්න තුල ගමන් කරන හෙයින් රැකියා සම්බන්ධයෙන් යම් යම් බාධාවක් ඇති කරයි.

මෙවැනි බාධාවක් ඇති වුවද 2012 අගෝස්තු මාසයෙන් පසුව මෙම තත්ත්වය රැකියා සම්බන්ධයෙන් මීට වඩා යහපත් තත්ත්වයට පත් කෙරේ. මෙම දිනයේ සිට රැකියා සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන්න. මෙම දිනය් සිට රැකියා සම්බන්ධ යහපත් තත්ත්වයක් ඇති කරයි. උසස්ම රැකියාවක් හා පහසුකම් සහිත රැකියා ලබා ගැනීමට වඩාත්ම යෝග්‍ය වන්නේ 2014 පසුවය. ඔබට රැකියා ලබා ගැනීමේ වාසනා ගුණය ඇති කරයි. බාහිර වශයෙන් උපාධිය හැදෑරීමෙන් ප්‍රතිඵලදායක තත්ත්වයක් ලබා ගැනීමට පිළිවන.

විදේශ රැකියා සම්බන්ධයෙන් 2014 අග දක්වා බාධාවක් පවතින අතර එම කාලය අවසන් වන විට විදේශ රැකියා සම්බන්ධ අදහස් යටපත් වී යනු ඇත.

## රෝග තත්ත්වයන්

මෙම කේන්ද්‍රයේ රෝග කාරක ස්ථානය හිමි බ්‍රහස්පතී හතර වැන්න තුල තැන්පත්ව සිටින හෙයින් බලවත් රෝග තත්ත්වයන් ඇති නොවේ. චන්ද්‍රයා ගෙන් අට වැන්න තුල කේතු තැන්පත්ව සිටින හෙයින් සෙම් රෝග වැනි දේවල් වරින්වර ඇති වුවද ඒවා බලවත් නොවේ. දූනට අපල තත්ත්වයක් නොමැත. එබැවින් පූජා විධි අවශ්‍ය නොවේ. ඔබේ ජීවිතය වඩාත් යහපත් තත්ත්වයට පත් වන්නේ වයස අවුරුදු 30 ඉක්මවූ පසුවය.

## වර්තමාන තත්ත්වය හා අනාගතය

2011 නොවැම්බර් මාසයේ 13 වැනි දින සිට 2014 නොවැම්බර් මාසයේ 13 වැනි දින දක්වා කාලය ඇතුළත ඔබට පවතින්නේ රාහුගේ මහ දශාවේ සිකුරුගේ අන්තර් දශාවයි. මෙම අන්ර් දශා කාලය අයහපත් භාවයෙන් අඩු කෙරෙන හිතේ පවතින ප්‍රීතිමත් භාවය බෙහෙවින්ම වැඩි කෙරේ. 2012 මැයි මාසයේ 17 වැනි දින සිට බ්‍රහස්පතී එකොළොස් වැන්න වූ අයස්ථානයේ ගමන් කරයි. එබැවින් යම් යම් ආර්ථික ප්‍රතිලාභයක් අත්පත් කර ගැනීමට හා අන්‍යයන්ගේ ආධාර උපකාරයක් ලබා ගැනීමට අවස්ථාවන් ඇති කෙරේ.

මෙම කාලයේ බ්‍රහස්පතීගේ ගමන සමග සෙනසුරුගේ බල තත්ත්වයද යහපත් හෙයින් යම් යම් දේවල් ඉටු කිරීමට හිතේ පවත්නා ධෛර්ය සම්පන්න භාවය වැඩි වේ. මෙම තත්ත්වය 2012 අගෝස්තු මාසයේ 05 වැනි දිනේ සිට වඩාත් යහපත් තත්ත්වයට පත් කෙරේ. කරන කියන දේවල් වලින් යම් වෙහෙසක් ඇති වුවද ඒවායින් යම් යහපත් වූ ප්‍රතිඵලයක් ලබා ගැනීමට අවස්ථාව උදා කෙරේ. 2014 අන්තිම දක්වා කාලය යහපත් තත්ත්වයෙන් යුක්ත වේ.

## ජය වර්ණ / අංක / දවස්

අඟහරුවාදා, බ්‍රහස්පතින්දා, දවස් වල ශුභ කාර්යයන් ඉටු කිරීමෙන් හොඳ ප්‍රතිඵල අත්පත් කර ගැනීමට අවස්ථාවක් උදා කෙරේ. අංක 2, 7, 9 සමග රතු, සුදු, කහ වර්ණ තම ජීවිතයට සම්බන්ධ කර ගන්න. මුතු, දියමන්ති සහ කහපාට මැණික් පැළඳීමෙන් අපල තත්ත්වයන් අවසන් කෙරෙන අතර වාසනා ගුණය ඉස්මතු කෙරේ.

ස්තුතියි.

2012.04.29